# විශ්‍රාම වැටුප් ඔබට ලැබෙන හැටි

**යෝජනා ක්‍රමයේ මූලික ලක්ෂණ හා පරමාර්ථ**

මෙම යෝජනා ක්‍රමයට දායකවීම සඳහා සිය කැමැත්තෙන්ම ඉදිරිපත් වියයුතු අතර, ඒ සඳහා දායක මුදලක් ද ගෙවිය යුතු වේ. මෙම යෝජනා ක්‍රමය බැහැරින් ඉදිරිපත් කරන අසරණාධාර ක්‍රමයකට වඩා ගොවි ජනතාවගේ ස්වෝත්සාහයෙන් ආරම්භ කරන ක්‍රමයක ලක්ෂණ තිබිය යුතු බැව් අදහස් කරන ලදී. මේ නිසා එකී යෝජනා ක්‍රමය ගොවි ජනතාව සම්පූර්ණයෙන්ම සහභාගි නොවන ක්‍රමයට වඩා බෙහෙවින් ආත්මාධාරය හා ස්වෝත්සාහය වැනි ගුණාංග පදනම් කර ගත් එකකි. එවැනි යෝජනා ක්‍රමයක් ගොවි ජනතාවගේ ආත්මාභිමානය ආරක්ෂා කරන සුළුය. එසේ වුවත් ජනතාවට අත්‍යාවශ්‍ය ආහාර සැපයීමේ මාහැඟි හා උදාර කර්තව්‍යයට කෙරෙන උපහාරයක් වශයෙන් ගොවි ජනතාවට ජීවත්වීමට ප්‍රමාණවත් විශ්‍රාම වැටුපක් ලබාදීම හා එය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වන පුනරාවර්තන වියදම් ආධාරයක් වශයෙන් රජයෙන් දීමට සැළසුම් කර ඇත.

වත්මන් කෘෂිකාර්මික අංශයේ ලක්ෂ 18 ක් පමණ වන ගොවි ජනතාව ගෙන් ඉටුවන මාහැඟි සේවය අගය කරන අතර, ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ ප්‍රතිලාභ අත්කර දීමේ ඉලක්ක කළ කණ්ඩායම වන්නේ. යැපුම් මට්ට මේ වී සහ වෙනත් ආහාර බෝග වගා කරන ගොවි ජනතාවයි.

ගොවිතැන් කටයුතු වල නිරත වෙමින් රාජ්‍ය හෝ පෞද්ගලික අංශයේ රැකියාවල නියුක්ත විශ්‍රාම වැටුප් හෝ සේවක අර්ථ සාධක අරමුදල් වැනි වෙනත් සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ වලට හිමිකම් ලබන අයට මෙම යෝජනා ක්‍රමයට දායක විය නොහැක. ඊට අතිරේකව මහළු වියේදී හොඳින් ජීවත්වීම සඳහා ප්‍රමාණවත් සම්පත් තිබෙන ඉහළ ආදායම් ලබන ගොවීන්ට ද මෙම යෝජනා ක්‍රමයට ඇතුළත් වීමට හිමිකම් නැත.

**යෝජනා ක්‍රමයේ පරමාර්ථ**

යෝජනා ක්‍රමය පහත සඳහන් පරමාර්ථ ඉටු කිරීමට අපේක්ෂා කරයි.

1. ගොවීන්ගේ මහළු කාලය ගත කිරීමට වැටුපක් සහ කිසියම් ආකාරයකින් බෙලහීනතාවයකට පත්වුවහොත් ඔහුගේ යැපීම සඳහා ප්‍රමාණවත් ජීවනාධාරයක් සැපයීම.

11. ගොවියෙකුගේ අකල් මරණය නිසා එම පවුලට ඇතිවන ආර්ථික අපහසුතා මගහැර ගැනීම සඳහා යැපෙන්නන්ට මුදල්මය ආධාරයක් වශයෙන් මරණ පාරිතෝෂිකයක් ලබාදීම.

111. අර්ථවත් සමාජ ආරක්ෂණ පියවරක් හැටියට ජීවිත රක්ෂණය ගොවි ජනතාවට වඩාත් සමීප කරවීම.

1V. ගොවි ජනතාව අතර ඉතිරි කිරීමේ පුරුද්ද වැඩි දියුණු කිරීම.

V. ආර්ථිකය තුළ ගොවි ජනතාව ඉටු කරන කාර්යය භාරය සැළකිල්ලට ගෙන ගොවි තැන ආරක්ෂිත වෘත්තියක් බවට පත් කිරීම.

V1. කෘෂිකර්ම රක්ෂණ මණ්ඩලයේ සේවාවන් ගොවි ජනතාව අතර වඩාත් පුළුල් කිරීම.

දායකත්වය සඳහා සුදුසුකම් :

නියමිත සුදුසුකම් දරන්නාවූ වයස අවුරුදු 18 ට නොඅඩු වයස අවුරුදු 59 ට නොවැඩි ගොවීන්ට මෙම යෝජනා ක්‍රමයේ දායකත්වය ලබා ගැනීම සඳහා හිමිකම් ඇත.

මෙම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක වන පළමු අවස්ථාවේදී පහත, සඳහන් බෝග වගා කරන ඉඩම් හිමි ගොවීන්, අඳ ගොවීන්, බදු ඉඩම් හිමි ගොවීන් දායකත්වය ලබා ගැනීම සඳහා සුදුස්සන් වේ.

1. වී සහ අනෙකුත් ධාන්‍ය වර්ග.
11. අතිරේක බෝග සහ එළවළු.
111. අල වර්ග.
1V. පලතුරු.
V. බුලත්.
V1. උක්.

1. ගොවිතැන් කටයුතුවල නිරතවන පිරිස් අතරින් පහසුවෙන් හඳුනා ගත හැකි කණ්ඩායම් පමණක් බඳවා ගතහැකි වන පරිදිද,

11. දැනටමත් වෙනත් සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ ක්‍රමයක ප්‍රයෝජන ලබන ගොවීන් මෙම යෝජනා ක්‍රමයට බැඳීම වළක්වන පරිදිද,

111. රජයෙන් සැපයෙන සහනාධාරයේ ප්‍රයෝජන ඉහළ ආදායම් ඇති ගොවීන්ට ලැබීම වැළැක්වෙන පරිදිද,

පහත සඳහන් සුදුසුකම් පුළුල් වශයෙන් නිර්ණය කර ඇත.

1. ස්වාමි පුරුෂයා සහ භාර්යාවට අයත් වගා කරන මුළු ඉඩම් ප්‍රමාණය අක්කර 10 කට වඩා වැඩි නොවිය යුතුය.

11. ස්වාමි පුරුෂයා සහ භාර්යාව විසින් වගා කරන වී ගොවිතැන් හා උස්බිම් ප්‍රමාණය අක්කර 10 කට නොවැඩි නොවිය යුතුය.

111. විශ්‍රාමිකයෙකු හෝ සේවක අර්ථ සාධක අරමුදලේ ප්‍රතිලාභ ලැබූවෙකු හෝ විශ්‍රාම වැටුප් හෝ අර්ථ සාධක අරමුදලේ ප්‍රතිලාභ හිමි රැකියාවක නියුක්ත අයෙකු නොවිය යුතුය.

1V. කලත්‍රයාගේ අභාවයෙන් පසුව වැන්දඹු අනාථ දරු විශ්‍රාම වැටුප් අයිතියක් නොලැබෙන අයෙකු විය යුතුය.

1V. ආදායම් බදු ගෙවන්නකු නොවන හෝ බදු ගෙවීමට ප්‍රමාණවත් තක්සේරු ආදායමක් නොමැති අයෙකු විය යුතුය.

මෙහි දක්වා ඇති වාර මුදල් ප්‍රමාණයන් අනුව අවුරුදු 45 සිට 59 දක්වා වයසේ ගොවීන්ට මෙම යෝජනා ක්‍රමයට ඇතුළත් වීමේ අවස්ථාව ලැබෙනුයේ යෝජනා ක්‍රමය ආරම්භ කර අවුරුදු දෙකක් ගතවන තුරු පමණි. ඒ කාලය ඉකුත්වීමෙන් පසුව යෝජනා ක්‍රමයට බැඳීමට හැකියාව ඇත්තේ මෙහි සඳහන් වාර මුදලට වැඩි වාර මුදලක් ගෙවීමෙනි.

යෝජනා ක්‍රමයට ගෙවිය යුතු දායක මුදල්

01. දායකයාගේ වයස අවුරුදු 60 සම්පූර්ණ වනතුරු හෝ බෙල හීනතාවය හෝ මරණය සිදුවන තෙක් අර්ධ වාර්ෂිව සෑම දායකයෙකු විසින්ම වාරික මුදලක් ගෙවිය යුතුවේ. යෝජනා ක්‍රමයට ඇතුළත්වීමේදී අර්ධ වාර්ෂිකව දායකයෙකු විසින් ගෙවිය යුතු වාරික මුදල දායකයාගේ වයස මත පදනම් වී සකස් වී ඇත. මෙහිදී වයස නිගමනය

වන්නේ ඇතුළත් වන දිනට පසුව එළඹෙන උපන් දිනය මත ගණනය කිරීමෙනි.

02. අර්ධ වාර්ෂික දායක මුදලක් වශයෙන් යෝජනා ක්‍රමයට ඇතුළත් වන විට වයස අවුරුදු 18 දී ගෙවිය යුතු මුදල් ප්‍රමාණය රු. 130/- සිට ඇතුළත්වීමේදී වයස අවුරුදු 54 ක් වූවකු විසින ගෙවිය යුතු රු. 700/- දක්වා වෙනස් වේ. ඇතුළත් වන විට වයස අවුරුදු 55 සිට 59 දක්වා වූ ගොවීන් විසින් ගෙවිය යුතු වාරික මුදල රු. 690/- කි.

03. වාරික මුදල් පිළිවෙලින් අප්‍රේල් මස 01 වන දින හා ඔක්තෝම්බර් මස 01 වන දිනට පූර්ව ගෙවිය යුතුය. එහෙත් වාරික මුදල් ගෙවීම සඳහා දින 60 ක සහන කාලයක් ඇත. අදාළ සහන කාලය තුළදී වාරික මුදල් නොගෙවන්නේ නම් ඔහු වෙත නිකුත් කර ඇති ගිවිසුම් පත්‍රයෙන් ලැබෙන සහනයන්ට යටත්ව අවලංගු විය හැකිය.

**යෝජනා ක්‍රමයේ ප්‍රතිලාභ :**

01. විශ්‍රාම වැටුප්

යෝජනා ක්‍රමයේ දායකත්වය ලබා නියමිත වාරික මුදල් ගෙවා ක්‍රියාකාරී ලෙස ගිවිසුම තබා ගන්නා දායකයන් පහත සඳහන් ප්‍රතිලාභවලට හිමිකම් ලබති.

1. දායකයකුගේ වයස අවුරුදු 60 සම්පූර්ණ වූ දින සිට මිය යන මාසයේ අවසානය දක්වා විශ්‍රාම ලැබීමට.

11. වයස අවුරුදු 54 න් පසු දායකත්වය ලබන ගොවියෙකු විසින් සම්පූර්ණ වාරික ගණන ගෙවා දායකත්වය ලැබූ දින සිට අවුරුදු හයක් ගතවීමෙන් පසු විශ්‍රාම වැටුප් ලැබීමට.

111. ඇතුළත් වන අවස්ථාවේ දායකයන්ගේ වයස, දායක මුදල් ගෙවන කාල පරිච්ඡේදය, දායක මුදලේ ප්‍රමාණය අනුව දායකයාට ගෙවිය යුතු විශ්‍රාම වැටුප සකස් වේ.

මෙම යෝජනා ක්‍රමයේ දායකත්වය ලබන අවස්ථාවේ වයස අවුරුදු 18 සම්පූර්ණ වූ දායකයෙකුට වාරික

84 ක් ගෙවීමෙන් පසු වයස අවුරුදු 60 සම්පූර්ණ වූ විට අර්ධ වාර්ෂිකව රු. 25000/- ක විශ්‍රාම වැටුපක් ගෙවනු ලැබේ.

යෝජනා ක්‍රමයේ දායකත්වය ලබන අවස්ථාමේ වයස අවුරුදු 54 සම්පූර්ණ වූ ගොවීන්ට අර්ධ වාර්ෂික 12ක් ගෙවීම සම්පූර්ණ කිරීමෙන් පසු රු. 1600/- ක අර්ධ වාර්ෂික විශ්‍රාම වැටුපකට හිමිකම් ලැබේ.

දායකත්වය ලබන අවස්ථාවේ අවුරුදු 55-59 අතර වයසැති දායකයන්ට අර්ධ වාර්ෂික වාරික 10 ක් ගෙවීමෙන් පසු රු. 1200/- ක අර්ධ වාර්ෂික විශ්‍රාම වැටුපකට හිමිකම් ලැබේ.

විශ්‍රාම වැටුප දයකයාට පමණක් හිමිවන අතර, ඔහුගේ ඇවෑමෙන් පසු වෙනත් අයෙකුට පැවරීමට හෝ අන් සතු කිරීමට නොහැකිය. තමාට හිමි විශ්‍රාම වැටුප ලැබීමට හිමිකම් ලබන දිනයට ප්‍රථම දායකයාගේ මරණය සිදුවුවහොත් ශුද්ධ දායක මුදල සහ ඊට අදාළ පොළිය දායකයා විවාහ වී ඇත් නම් භාර්යාවට හෝ ස්වාමි පුරුෂයාටද, අවිවාහක හෝ වැන්දඹු නම් නෛතික උරුමක්කරුටද, ගෙවනු ලබන අතර, මරණය සිදුවන්නේ විශ්‍රාම වැටුප ලැබීමට හිමිකම් ලබන දිනයට පසු නම් ශුද්ධ දායක මුදල සහ ඊට ලැබිය යුතු පොළියේ එකතුවෙන්, එතෙක් විශ්‍රාම වැටුප ලෙස තමා ලබාගත් ප්‍රමාණය අඩු කළ විට ඉතිරි ප්‍රමාණය එම දායකයාගේ නෛතික උරුමක්කරුට ගෙවනු ලැබේ.




**බෙලහීන ප්‍රතිලාභ සහ මරණ පාරි තෝෂික දීමනාව**

1. යම් දායකයෙකුගේ වයස අවුරුදු 60 සම්පූර්ණ වීමට පෙර අර්ධ හෝ ස්ථිර බෙලහීනතාවයකට පත්වුවහොත් ඔහුට/ඇයට බෙල හීනතා ප්‍රතිලාභ දීමනාව ලබා ගැනීම හෝ බෙලහීනවූදා සිටම තව දුරටත් දායක මුදල් නො ගෙවා වයස අවුරුදු 60 සම්පූර්ණ වූ විට වාරික දීමනාවක් ජීවිතාන්තය දක්වාම ලබා ගැනීම.

11. යම් දායකයෙකු පූර්ණ හා ස්ථිර බෙලහීනතාවයකට පත්වුවහොත් පූර්ණ බෙලහීන දීමනාව ලබා ගැනීම හෝ තව දුරටත් දායක මුදල් නොගෙවා බෙලහීන වූදා සිටම වාරික දීමනාවක් ජීවිතාන්තය දක්වාම ලබා ගැනීම.

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙන් 'සමූහ ජීවිත රක්ෂණ' ක්‍රමයක් යටතේ මෙම යෝජනා ක්‍රමයේ දායකත්වය ලබන වයස අවුරුදු 54 ට නොවැඩි දායකයන් බෙලහීන ප්‍රතිලාභ හා මරණ පාරිතෝෂික දීමනා සඳහා හිමිකම් නොලබයි.

එක් දායකයෙකු වෙනුවෙන් රු. 30/- ක වාරික මුදලක් කෘෂිකර්ම රක්ෂණ මණ්ඩලය විසින් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට ගෙවනු ලැබීම නිසා පහත සඳහන් සිදුවීම් වලදී,

(අ) පූර්ණ සහ ස්ථිර බෙලහීනතාවය.

(ආ) අර්ධ සහ ස්ථිර බෙලහීනතාවය.

(ඇ) මරණය.

රක්ෂණ ගිවිසුමේ සඳහන් ගෙවීමට පොරොන්දු වූ මුදල් පහත සඳහන් වේ.

| ඊළඟ උපන් දිනය අනුව සිද්ධිය සිදුවූ දිනට වයස | 'අ' සිද්ධිය පූර්ණ හා ස්ථිර බෙලහීනතාවය | 'ආ' සිද්ධිය අර්ධ හා ස්ථිර බෙලහීනතාවය | 'ඇ' සිද්ධිය මරණය |
|---|---|---|---|
| අවු: 18-30 දක්වා | 28,000 | 14,000 | 14,000 |
| 31-35 | 24,000 | 12,000 | 12,000 |
| 36-40 | 18,000 | 9,000 | 9,000 |
| 41-45 | 12,000 | 6,000 | 6,000 |
| 46-60 | 8,000 | 4,000 | 4,000 |

මෙහි 'අ' 'ආ' 'ඇ' සිදුවීම් වලදී පොරොන්දු මුදල් ගෙවනු ලැබේ. මෙහි 'අ' සහ 'ආ' හි සඳහන් බෙලහීනතාවයන් පහත සඳහන් කරුණක් නිසා හටගත් බෙලහීනතාවයක් විය යුතුය.

1. දායකයෙකු වීමෙන් පසු බාහිර සාහසික ක්‍රියාවක සහ ඒ බවට දෘෂ්‍ය හේතුවකින් හදිසි අනතුර සිදුවී දින 60 ක් ගතවීමට පෙර ආබාධය ඇතිවිය යුතුය.

11. රක්ෂණ ගිවිසුමේ උප ලේඛනයේ ආරම්භ වන දින ලෙස සඳහන් දිනට

පසුව ඇතිවූ රෝගයක හේතුවෙන්,

**'අ' සිද්ධිය**

අනතුරකින් හෝ රෝගයකින් පහත දැක්වෙන කරුණක් මත පූර්ණ බෙලහීනතාවය ඇතිවීම.

(අ) අත්දෙක නැතිවීම.

(ආ) දෙපා නැතිවීම.

(ඇ) දෑස නොපෙනීම.

(එ) එක අතක් සහ එක පයක් නැතිවීම.

(ඉ) එක් අතක් නැතිවීම සහ එක් ඇසක් නොපෙනී යාම.

(ඊ) එක් පයක් නැතිවීම සහ එක් ඇසක් නොපෙනී යාම.

(උ) අනතුරකින් හෝ රෝගයකින් ගෙල සිට පහළට ආබාධිත වීම.

**'ආ' සිද්ධිය**

අනතුරකින් හෝ රෝගයකින් පහත දැක්වෙන බෙලහීනතා ඇතිවීම

(අ) එක් ඇසක් නොපෙනීම.

(ආ) එක් අතක් නැතිවීම.

(ඇ) එක් පයක් නැතිවීම.

**'ඇ' සිද්ධිය**

අනතුරකින් හෝ රෝගයකින් මරණය සිදුවීම

ගෙවනු ලබන බෙලහීන ප්‍රතිලාභ සහ මරණ පාරිතෝෂික ගණනය කරනු ලබන්නේ දායකයා බෙලහීන තත්ත්වයට එළඹි වයස පදනම් කර ගෙනයි. තරුණ අවදියේම බෙලහීන වුවහොත් ජීවිතයේ ඉදිරි කාලය ගෙන යාමට වැඩි බරක් ඉසිලීමට සිදුවන බැවින් තරුණ අවදියේම සිදුවන බෙලහීනතා සහ මරණ සඳහා වැඩි ප්‍රතිලාභයක් ගෙවනු ලැබේ.

වයස අවුරුදු 60 සම්පූර්ණ වීමට පෙර දායකයෙකු මියගිය විට නෛතික උරුමකරුට මරණ පාරිතෝෂිකය ගෙවනු ලැබේ.

දායකයෙකු පූර්ණ ස්ථිර බෙලහීනතාවයට පත්වුවහොත් ඔහුගේ ඇයගේ මනාපය පරිදි අනුගමනය කළ හැකි විකල්ප ක්‍රියා මාර්ග දෙකෙන්

එකක් තෝරාගත හැකිය.

1. පූර්ණ ස්ථිර බෙලහීන ප්‍රතිලාභ දීමනාවත්, දායකයා විසින් එතෙක් ගෙවා ඇති ශුද්ධ වාරික මුදලත්, කෘෂිකර්ම රක්ෂණ මණ්ඩලය විසින් තීරණය කරන ලද පොළී මුදලත්, එකවරම ලබා ගෙන යෝජනා ක්‍රමයෙන් ඉවත් වීම, හෝ

11. තවදුරටත් දායක මුදල් නොගෙවා බෙලහීන වූදා සිටම වාරික දීමනාවක් ජීවිතාන්තය දක්වාම ලබා ගැනීම.

දායකයෙකු අර්ධ බෙලහීනතාව පත්වූ විට ඔහුගේ/ඇයගේ මනාපය පරිදි අනුගමනය කළ හැකි පහත සඳහන් ක්‍රියා මාර්ග දෙකින් එකක් තෝරාගත හැකිය.

1. අර්ධ බෙලහීන ප්‍රතිලාභ දීමනාවත්, දායකයා විසින් එතෙක් ගෙවා ඇති ශුද්ධ වාරික මුදලත්, කෘෂිකර්ම රක්ෂණ මණ්ඩලය විසින් තීරණය කරන ලද පොළී මුදලත් එකවරම ලබාගෙන යෝජනා ක්‍රමයෙන් ඉවත් වීම, හෝ

11. බෙලහීන වූදා සිටම තව දුරටත් වාරික මුදල් නොගෙවා වයස අවුරුදු 60 සම්පූර්ණ වූ විට වාරික දීමනාවක් ජීවිතාන්තය දක්වාම ලබා ගැනීම.

දායකයකුට වයස අවුරුදු 60 සම්පූර්ණ වීමට අවුරුදු එකකට හෝ දෙකකට පෙර බෙලහීන තත්ත්වයට පත්වන විට ඔහු විසින් බෙලහීන තත්ත්වයට පත්වන තුරු ගෙවන ලද දායක මුදල් අනුව, ජීවිතාන්තය දක්වා ලබන වාරික දීමනාවට අමතරව එක්වර ගෙවන පාරිතෝෂික දීමනාවක්ද හිමිවේ.

**වගකීමෙන් බැහැර වන අවස්ථා :**

1. මරණ පාරිතෝෂික :

නියම වශයෙන් හෝ අනියම් ආකාරයකින් පහත දැක්වෙන කරුණක් හේතුවෙන් දායකයකුගේ මරණය සිදු වුවහොත් පොරොන්දු වූ මුදල් ගෙවනු නොලැබේ.

* යුද්ධය, ආක්‍රමණය, විදේශීය සතුරන්ගේ ක්‍රියා, යුද්ධයක් ප්‍රකාශ කළ විට හෝ නොකළ විට ඇති වූ සටන් වලදී, සිවිල් යුද්ධයකදී, විප්ලවයකදී, කැරලිලකදී, හමුදා හෝ බලහත්කාරයෙන් බලය ලබා ගත් අවස්ථාවකදී.
* ගාස්තු ගෙවා මගියෙකු ලෙස පිළිගත් ගුවන් යානාවක දායකයා ගමන් ගන්නා විටකදී හැර වෙනත් ආකාරයක ගුවන් හෝ අහස් යාත්‍රා හෝ අභ්‍යවකාශ තරණයක මෙම දායකයා යෙදුණු අවස්ථාවක.
* මෙම රක්ෂණ සහතිකය ආරම්භ වූ දින සිට අවුරුදු දෙකක කාලයක් තුළ සිහිවිකල්ව හෝ හොඳ සිහියෙන් පසුවෙද්දී සියදිවි හානිකර ගැනීම.

2. බෙලහීනතා ප්‍රතිලාභ :

පහත සඳහන් කාරණා හේතු කොටගෙන ඇතිවන බෙලහීනතාවයන්ට බෙලහීනතා ප්‍රතිලාභ ගෙවනු නොලැබේ.

* යුද්ධය, ආක්‍රමණය, විදේශීය සතුරන්ගේ ක්‍රියා, යුද්ධයක් ප්‍රකාශ කළ විට හෝ නොකළ අවස්ථාවකදී ඇතිවූ සටන්වලදී, සිවිල් යුද්ධයකදී, විප්ලවයකදී කැරලිලකදී හෝ හමුදා හෝ බලහත්කාරයෙන් බලය ලබාගත් අවස්ථාවකදී.
* ගාස්තු ගෙවා මගියෙකු ලෙස පිළිගත් ගුවන් යානාවක දායකයා ගමන් ගන්නාවිට හැර වෙනත් ආකාරයක ගුවන් හෝ අහස් යාත්‍රා හෝ අභ්‍යවකාශ තරණයක මෙම දායකයා යෙදුණු අවස්ථාවක.
* මත්පැන් හෝ මත් ද්‍රව්‍ය භාවිතා කිරීමෙන් තමාගේ ක්‍රියාවන් පාලනය කිරීමට නොහැකි අවස්ථාවල

දී කරන ලද හිංසාත්මක ක්‍රියා.

* සිහි විකල්ව හෝ හොඳ සිහියෙන් සිටිනවිටදී සියදිවි නසා ගැනීමට තැත් කිරීමකදී හෝ තමා විසින්ම තුවාල ඇතිකර ගත් අවස්ථාවකදී.
* අනීතික ක්‍රියාවක් කිරීම හේතු වෙන් බලය ලත් අයගේ අත් අඩංගුවේ පසුවෙන අවස්ථාවකදී.

**ගිවිසුමේ බලපාන කොන්දේසි**

01. මෙම යෝජනා ක්‍රමයේ දායකත්වය ලබන සියළුම දායකයන්ට ගිවිසුම් පත්‍රයක් නිකුත් කරනු ලැබේ. පහත සඳහන් හේතූන් නිසා ගිවිසුම අවලංගු වේ.

1. දායකයා විසින් යෝජනා ක්‍රමයට ඇතුළත් වීමේ දී අසත්‍ය කරුණු ප්‍රකාශ කිරීම හෝ කරුණු වසන් කර දායකත්වය ලබා ඇති බව අනාවරණය වීම.

11. අඛණ්ඩව වාරික පහක් හෝ ඊට වැඩි ගණනක් අර්ධ වාර්ෂික වාරික මුදල් ගෙවීම පැහැර හැරීම.

111. වෘත්තීය වෙනස්වීමෙන් මූලික සුදුසුකම් නොමැති වීම.

දායකයා විසින් යෝජනා ක්‍රමයට ඇතුළත් වීමේදී ඔහු විසින් සපයා ඇති සුදුසුකම් පිළිබඳ අසත්‍ය කරුණු ප්‍රකාශ කිරීම හෝ කරුණු වසන් කර ඇති බව යම් අවස්ථාවකදී ඔප්පු වුවහොත් ගිවිසුම අවලංගු කරනු ලැබේ.

ස්වාභාවික විපත් නිසා අස්වනු පාළුවී ගිය වාරික මුදල් ගෙවීමට අපොහොසත් වූ දායකයන්ට උපරිම වශයෙන් අවුරුදු 2 ක සහන කාලයක් දෙනු ලැබේ. අඛණ්ඩව වාරික පහක් ගෙවනු නොලැබුවහොත් මෙම ගිවිසුම අහෝසි කළ හැකිය. කෙසේ වෙතත් මෙම සහන කාල සීමාව තුළ බෙලහීන ප්‍රතිලාභ හෝ මරණ පාරිතෝෂික සඳහා හිමිකම් ලබයි.

1. ගිවිසුම අවලංගු වන අවස්ථාව දක්වා ගෙවන ලද වාරික මුදල් ණය ගෙවිය යුතු මුළු වාරිකවලින් 10% ක හෝ ඊට වඩා අඩු නම් ගෙවන ලද වාරික මුදල් දායකයාට අහිමි කරනු ලැබේ.

11. ගිවිසුම අවලංගු කරන අවස්ථාව දක්වා ගෙවන ලද වාරික මුදල් 10% කට වැඩි හෝ 75% කට අඩු නම් ගෙවා ඇති ශුද්ධ වාරික මුදලත්, පොලියත් දායකයාට වයස අවුරුදු 60 සම්පූර්ණ වූ විට ගෙවනු ලැබේ.

111. දායකයා විසින් ගෙවා ඇති වාරික මුදල 75% කට වඩා වැඩි වුවත් එකඟ වූ වාරික මුදල් ප්‍රමාණයට අඩුනම් නියමිත විශ්‍රාම වැටුපට අඩු විශ්‍රාම වැටුපක් දායකයාට හිමිවේ.

මෙම යෝජනා ක්‍රමයේ තව දුරටත් දායකත්වයේ සිටීමට සුදුසුකම් නොමැතිවීම වැනි ගිවිසුම අවලංගු කිරීමට සිදුවන අවස්ථාවලදී දායකයෙකු විසින් ගෙවන ලද ශුද්ධ දායක මුදල සහ ඊට අදාළ පොලී මුදල ඔහු විසින් අවසන් වරට මුදල් ගෙවූ දින සිට වර්ෂ දෙකක කාලයක් ගතවීමෙන් පසුව දායකයාට නැවත ගෙවිය හැකිය.

දායකයාගේ සුදුසුකම් හෝ සේවා තත්ත්වයේ වෙනස්වීම් නිසා දායකයා විසින් ගෙවන ලද වාරික මුදල් ආපසු ලබා ගැනීමට අපේක්ෂා කරන දායකයෙකු විසින් ඉහත කී වෙනස්වීම් සම්බන්ධව ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. දායකයන්ගේ සේවා තත්ත්වයන් නිතර වෙනස් විය හැකි නිසා මේ අන්දමින් ප්‍රකාශන ලබා ගැනීම කාලෝචිත දෙයක් ලෙස සලකනු ලැබේ.

දායකයෙකු විසින් ගෙවිය යුතු වාර මුදල් ප්‍රමාණයෙන් 10% ක් වත් ගෙවීමට අපොහොසත්වූ අවස්ථාවකදී හැර වෙනත් හේතූන් නිසා දායකයෙකුගේ ගිවිසුම අහෝසි කිරීමට සිදුවුවහොත් අළුත් දායකයෙකු ලෙස නැවතත් ඔහුට මෙම යෝජනා ක්‍රමයේ දායකත්වය ලබාගත හැකිය. තවද

ඔහු විසින් ගෙවන ලද වාර මුදල් නව දායකයෙකු ලෙස යෝජනා ක්‍රමයට බැඳෙන අවස්ථාවේදී ගෙවිය යුතු නව වාර මුදල් වෙනුවෙන් හිලව් කර ගැනීමට අවස්ථාව ලබා දී ඇත.

දායකයෙකුට තම වාර මුදල් කලින් ගෙවිය හැකිය. වාර මුදල් ගෙවූ දින සිට ඒ වෙනුවට පොලී ලබා ගැනීමට හිමිකම් තිබෙන නිසා දායකයෙකුට කලින් මුදල් ගෙවීම වෙනුවෙන් විශේෂ වට්ටම් සහනයක් නොලැබේ.

**යෝජනා ක්‍රමයේ පාලනය**

1973 අංක 27 දරණ කෘෂිකාර්මික පනත යටතේ පිහිටුවන ලද කෘෂිකර්ම රක්ෂණ මණ්ඩලය විසින් මෙම යෝජනා ක්‍රමය මෙහෙයවනු ලබයි.

අදාල සුහ සාධක කටයුතු වලට සමාන අංශවල නිරතවීමෙන් හසල දැනුමක් හා පලපුරුද්දක් ඇති අය ගෙන් පත්කර ගන්නා ලද උපදේශක කමිටුවක් විසින් මණ්ඩලයේ මෙහෙයුම් කටයුතුවලට සහාය වේ.

ප්‍රධාන කාර්යාලයේ සහ දිස්ත්‍රික් කාර්යාලවල නියුක්ත කෘෂිකර්ම රක්ෂණ මණ්ඩලයේ නිලධාරීන් මෙම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට වග කිව යුතුවේ.

ග්‍රාමීය කෘෂිකාර්මික කටයුතු වලට සම්බන්ධ විවිධ රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධානවල හා ඒවායේ නිලධාරීන්ගේ සහාය ඇතිව කෘෂිකර්ම රක්ෂණ මණ්ඩලයේ දිස්ත්‍රික් නිලධාරීන් විසින් යෝජනා ක්‍රමය හඳුන්වා දීමේ ප්‍රචාරක කටයුතු කිරීමට නියමිතය.

**යෝජනා ක්‍රමයට බඳවා ගැනීමේ අයදුම්පත් පහත සඳහන් ස්ථාන වලින් ගොවීන්ට ලබා ගත හැකිමේ.**

**1. සියළුම ගොවිජන සේවා මධ්‍ය ස්ථාන.**

11. මහවැලි කොට්ඨාශ හා ඒකක කාර්යාල.

111. සහකාර ගොවිජන සේවා කොමසාරිස් කාර්යාල.

1V. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂ කාර්යාල.

V. සියළුම සමුපකාර සමිතිවල සමුපකාර ග්‍රාමීය බැංකු ශාඛා.

V1. ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ජනපද නිලධාරි කාර්යාල.

V11. කෘෂිකර්ම රක්ෂණ මණ්ඩලයේ දිස්ත්‍රික් කාර්යාල.

V111. මහවැලි උප කාර්යාල.

ඉල්ලුම් පත්‍රය සමග නිකුත් කරන උපදෙස් පත්‍රිකා හා ලියවිලි සඳහා රු. 1/- ක මුදලක් අය කරනු ලැබේ.

ඉල්ලුම් පත්‍රය සම්පූර්ණ කර එහි 6 වන ඡේදයේ සඳහන් විස්තර නිවැරදි බවට 10 වෙනි ඡේදයේ අදාල නිලධාරීගේ සහතිකය සමග කෘෂිකර්ම රක්ෂණ මණ්ඩලයේ දිස්ත්‍රික් නිලධාරීන් වෙත භාරදීම අවශ්‍යය. පහසුවෙන් ඉල්එම් පත්‍ර භාරදීමට අවශ්‍ය විධිවිධාන එකී නිලධාරීන් විසින් නිකුත් කරනවා ඇත.

බඳවා ගැනීමට සුදුසුකම් ඇති ගොවීන්ගෙන් පළමුවන වාරික මුදල අයකර ඊට ලදුපතක් හා වාර මුදල් ගෙවීමේ පාස්පොතද ඒ අවස්ථාමේදීම මණ්ඩලයේ නිලධාරීන් විසින් නිකුත් කරනවා ඇත.

ඉන් අනතුරුව දෙවන වාරික මුදලේ සිට අවසාන වාරිකය දක්වා ගෙවිය යුතු වාර මුදල් ගෙවීමේ නියෝජිත ආයතනය වශයෙන් දායකයාගේ මනාපය පරිදි දැනට පහත සඳහන් ආයතනවලින් එකක් තෝරා ගත හැකිය.

1. සමුපකාර සමිතිවල ග්‍රාමීය බැංකු ශාඛාව.
11. මහවැලි අධිකාරියේ බල ප්‍රදේශය තුළ මහවැලි කොට්ටාශ හෝ ඒකක කාර්යාලය හෝ මහජන බැංකු ලංකා බැංකු ශාඛාව.
111. ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු ශාඛාව.

(කෘෂිරක්ෂණ මණ්ඩලයේ ප්‍රකාශන - යකින් උපුටා ගන්නා ලදී.)

**ඔබට සහන ලැබෙන අයුරු මෙන්න**

| බැඳෙන දිනට පසු එළඹෙන ඊළඟ උපන් දිනට වයස අවුරුදු | ගෙවිය යුතු වාරික ගණන | අර්ධ වාර්ෂික දායක මුදල (රුපියල්) | අර්ධ වාර්ෂික විශ්‍රාම වැටුප (රුපියල්) |
|---|---|---|---|
| 18 | 84 | 130 | 25000 |
| 19 | 82 | 135 | 23000 |
| 20 | 80 | 140 | 21000 |
| 22 | 76 | 145 | 19000 |
| 23 | 74 | 150 | 18000 |
| 24 | 72 | 155 | 17000 |
| 25 | 70 | 160 | 16000 |
| 26 | 26 | 165 | 15000 |
| 28 | 64 | 170 | 14000 |
| 28 | 64 | 175 | 13000 |
| 29 | 62 | 180 | 12000 |
| 30 | 60 | 185 | 11000 |
| 31 | 58 | 190 | 10000 |
| 32 | 56 | 200 | 9500 |
| 33 | 54 | 215 | 9000 |
| 34 | 52 | 225 | 8500 |
| 35 | 50 | 235 | 8000 |
| 36 | 48 | 250 | 7500 |
| 37 | 46 | 260 | 7000 |
| 38 | 44 | 270 | 6500 |
| 39 | 42 | 285 | 6000 |
| 40 | 40 | 295 | 5500 |
| 41 | 38 | 305 | 5000 |
| 42 | 36 | 320 | 4500 |
| 43 | 34 | 335 | 4200 |
| 44 | 32 | 360 | 3900 |
| 45 | 30 | 380 | 3600 |
| 46 | 28 | 400 | 3300 |
| 47 | 26 | 430 | 3100 |
| 48 | 24 | 455 | 2900 |
| 48 | 24 | 490 | 2700 |
| 49 | 22 | 525 | 2500 |
| 50 | 20 | 545 | 2300 |
| 51 | 18 | 565 | 2100 |
| 52 | 16 | 590 | 1900 |
| 53 | 14 | 640 | 1700 |
| 54 | 12 | 700 | 1600 |
| 55-59 | 10 | 690 | 1200 |